**1990 සුවසැරිය පදනම - 2020**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**--------------**

### 1.1 මතය

**------**

1990 සුවසැරිය පදනමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, සමුච්චිත අරමුදල වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ලාභ අරමුණු කර නොගත් සංවිධාන සඳහා නිර්දේශිත ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

**-----------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------------**

ලාභ අරමුණු කර නොගත් සංවිධාන සඳහා නිර්දේශිත ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, පදනම ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අප්‍රේල් 24 දින සෞඛ්‍ය අමාත්‍යාංශය හා GVK EMRI Lanka (Private) Ltd. ආයතනය සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම සහ 2018 අංක 18 දරන 1990 සුවසැරිය පදනම පනතේ 26(ඇ) වගන්තිය ප්‍රකාරව, සුවසැරිය පදනමේ මෙහෙයුම් කටයුතු සඳහා වැය වන පුනරාවර්තන වියදම් රජය විසින් ප්‍රතිපූරණය කළ යුතු වුවද, 2020 ජනවාරි 01 දින වන විට රු.337,179,826 හා සමාලෝචිත වර්ෂයට අදාළව රු.68,044,458 ක් රජය විසින් ප්‍රතිපූරණය කර නොතිබුණි. ඒ අනුව 2020 දෙසැම්බර් 31 දින වන විට රජය විසින් ප්‍රතිපූරණය කර නොතිබුණු මුළු පුනරාවර්තන වියදම රු.405,224,284 ක් වූ අතර එම වියදම ප්‍රාග්ධන වියදම් සඳහා ලැබී තිබුණු අරමුදල්වලින් වැයකර තිබුණි. එසේම 2019 වර්ෂය සඳහා රජය විසින් පදනමට ලබාදුන් මූල්‍ය ප්‍රතිපාදනය 2021, 2022 හා 2023 වර්ෂවලදී පිළිවෙලින් සියයට 25 ක් සියයට 50 ක් හා සියයට 75 ක් දක්වා අඩුකිරීමට 2019 අගෝස්තු 27 දින අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණු අතර මූල්‍ය ප්‍රතිපාදන අඩුකිරීමෙන් පසුව පදනම පවත්වාගෙන යාම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණි. නමුත් එවැනි යොජනාවක් 2021 නොවැම්බර් 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණු අතර මෙම තත්ත්වය පදනමේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි ඍජුව බලපෑ හැකි බව නිරීක්ෂණය විය. | කළමනාකාරිත්වය වශයෙන් අදාළ සියළුම ලිපි ලේඛන හා හිමිකම් අදාළ අමාත්‍යාංශ වෙත ඉදිරිපත් කර ඇති බව, සම්පූර්ණ වියදම ප්‍රතිපූර්ණය කිරීමකින් තොරව කාර්යක්ෂම මෙහෙයුමක් ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතා පිළිබඳව අවධාරණය කළ බව, එක් පැමිණීමකට ඩොලර් 2 බැගින් අය කිරීමට සැලසුම් ක්‍රියාත්මක වෙමින් පැවතුන නමුත් ආණ්ඩු වෙනස්වීම් හා අමාත්‍යාංශ වෙනස්වීම් හේතුවෙන් එය ක්‍රියාත්මක නොවූ බව හා 2021 වර්ෂයේදී රාජ්‍ය අමාත්‍යාංශයටද මෙම තත්ත්වය දැනුම්දී ඇති බව. | මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් සමඟ සාකච්ඡා කර ආයතනය බාධාවකින් තොරව පවත්වාගෙන යැම සඳහා සුදුසු යාන්ත්‍රනයක් ස්ථාපිත කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1957 අංක 60 දරන පනතින් සංශෝධිත 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) ආඥා පනතේ 3 වන වගන්තිය | සේවකයෙකු කිසියම් දිනයක වැඩ පටන් ගන්නා වේලාවේ සිට එම දිනයේදී ඔහු වැඩ නවත්වන වේලාව දක්වා කාලය පැය දොළසකට වඩා වැඩි නොවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී පදනමේ ප්‍රධාන කාර්යාලය සඳහා ආරක්ෂක සේවා ලබා ගැනීමේදී ආරක්ෂක නිලධාරීන් පැය 12 ක් ඉක්මවා සේවයේ යොදවා තිබුණි. 2020 ජූලි මාසයේ සති 03ක් හා නොවැම්බර් මාසයේ සති 04ක් එකම සේවකයෙකු අඛණ්ඩව සේවයේ යොදවා තිබුණු බව නියැදි පරීක්ෂණයකදී අනාවරණය විය. නමුත් පනතේ සඳහන් විධිවිධානවලට අනුකූලවන ලෙස ආරක්ෂක සේවා ගිවිසුම පිළියෙල කර නොතිබුණු බැවින් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගත නොහැකිවී තිබුණි. | ආරක්ෂක සේවාව තුන්වන පාර්ශව ආරක්ෂක සමාගමකට පවරා ඇති බව, ගිවිසුමට අනුව ක්‍රියා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස දැනටමත් ආරක්ෂක සමාගමට දන්වා ඇති බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු බවට කොන්දේසි ආරක්ෂක සේවා ගිවිසුමට ඇතුළත් කළ යුතු අතර අදාළ කොන්දේසි අනුව කටයුතු කරන බවට සහතික විය යුතුය. |
| (ආ) | 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත හා 1465/19 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය | ඕනෑම මුදල් ලැබීම් හෝ ගෙවීම් අවස්ථාවකදීම රු.25,000 ට වැඩි වටිනාකම් වෙනුවෙන්ම රු.25 ක මුද්දර ගාස්තුවක් අයකළ යුතු වුවත්, සේවක වැටුප් හැර අනෙකුත් ගෙවීම්වලදී මුද්දර ගාස්තු අයකර නොතිබුණි. | නියමිත පරිදි මුද්දර බදු අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. | මුද්දර බදු පනතේ විධිවිධාන ප්‍රකාරව මුද්දර බදු අයකළ යුතුය. |
| (ඇ) | ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 9.1 වගන්තිය | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව, නිලධාරියෙක් වෙත කිලෝමීටරයට රු.2.00 ක සැතපුම් කුලියක් ගෙවිය හැකි නමුත්, එම විධිවිධානවලට පටහැනිව හා ආයතන අධ්‍යක්ෂකගෙන් ලබාගත් විධිමත් අනුමැතියකින් තොරව, ගිලන් රථ සේවාව අධීක්ෂණ කටයුතු වෙනුවෙන් දිස්ත්‍රික් මට්ටමින් ස්ථානගත කර තිබුණු අධීක්ෂණ නිලධාරීන්ට ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සඳහා තම | දිවයින පුරා ප්‍රාදේශීය කාර්යාල නොමැති බැවින් සේවාවන්හි ගුණාත්මක බව පවත්වා ගැනීම සඳහා ක්ෂේත්‍ර කටයුතු සම්පව අධීක්ෂණය කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් ස්ථාන භාර නිලධාරීන් යොදවා ඇති බව, ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා ඔවුන් භාවිතා කරන තම පුද්ගලික වාහන සඳහා | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | පෞද්ගලික යතුරුපැදිය භාවිතා කිරීමටත් ඒ සඳහා පදනම විසින් කිලෝමීටරයකට රු.18 බැගින් ගෙවීමටත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව 2020 වර්ෂය තුළ අවස්ථා 239 කදී කිලෝමීටරයට රු.18 ක් බැගින් මුළු එකතුව රු.6,122,232 ක් අධීක්ෂණ නිලධාරීන් වෙත ගෙවා තිබුණු අතර වැඩිපුර ගෙවා තිබුණු මුදල රු.5,441,984ක් විය. | ඉන්ධන දීමනාවක් ගෙවනු නොලබන බව හා කිලෝමීටරයකට රු.2 ක දීමනාවක් ගෙවීම ප්‍රායෝගික නොවන බැවින් පාලක මණ්ඩලයේ අනුමැතිය මත කිලෝමීටරයකට රු.18 ක් ගෙවන බව. | |
| (ඈ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 4.2.6 ඡේදය | කාර්තුමය වශයෙන් කාර්යසාධන වාර්තා පිළියෙල කර අදාළ අමාත්‍යාංශය වෙත සහ භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත සෑම කාර්තුවක් අවසාන වීමට දින 30 කට පෙර යැවිය යුතු වුවද පදනම විසින් එසේ සිදුකර නොතිබුණි. | 2022 වර්ෂයේදී චක්‍රලේඛය අනුව කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදය | අස්ථිත්වයක් විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු අතර අවම වශයෙන් වසර 03 කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කළ යුතු වුවද, පදනම විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2022 වර්ෂයේදී මේ අනුව කටයුතු කරන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

--------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,443,011 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.392,433,414 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.395,876,425 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පදනමේ විදේශ විනිමය හුවමාරු ලාභය ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි. කෙසේ වුවද, පදනම ලාභ පාඩු අරමුණු කර නොගත් සංවිධානයක් වූ බැවින් පදනමේ ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා ඉන්දීය රජයෙන් ලබාදී තිබුණු ආධාර ගිණුමට මෙම අතිරික්තය මාරුකර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) පදනම සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක් බැවින් වෛද්‍ය සැපයීම් අංශය මඟින් ඖෂධ මිලදී ගැනීමේ හැකියාව පැවතියදී, වෛද්‍ය සැපයීම් අංශය විසින් මිලදී ගෙන තිබුණු මිලට වඩා වැඩි මිලකට ගිලන්රථ 297 ක පාවිච්චිය සඳහා අවශ්‍ය ඖෂධ හා වෛද්‍ය පරිභෝජන ද්‍රව්‍ය වෙනත් බාහිර පාර්ශවයන්ගෙන් සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණු අතර වැයකර තිබුණු මුළු මුදල රු.8,721,138 ක් විය. | වෛද්‍ය සැපයුම් අංශය ඖෂධ සහ පරිභෝජන ද්‍රව්‍ය අලෙවි කරන ආයතනයක් නොවන බැවින් වෛද්‍ය සැපයුම් අංශය වෙතින් ඖෂධ මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේදයන් අනුගමනය කිරීමට නොහැකි වූ බව, 2020 වර්ෂයේදි මාසික අවශ්‍යතා සඳහා වෛද්‍ය සැපයුම් අංශය වෙත ඉල්ලීම් ඉදිරිපත් කළ අතර ඒ අනුව යම් ප්‍රමාණයක් නොමිලේ ලැබුණු බව, ලැබුණු ප්‍රමාණය අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් නොවූ බැවින් බාහිර සැපයුම්කරුවන්ගෙන් මිලදී ගැනීමට සිදුවූ බව, මෙහිදි රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙන් මිලදී ගැනීමට ප්‍රමුඛත්වය ලබා දී ඇති බව. | අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර මේ සඳහා විධිමත් ක්‍රමවේදයක් පිළියෙල කරගත යුතුය. |
| (ආ) ගිලන් රථ සේවාවේ යෙදෙන කාර්ය මණ්ඩලය සඳහා මාත්‍රා 03 කින් සම්පූර්ණ කළ යුතු වූ හෙපටයිටිස් බී එන්නත (Hepatitis B Vaccine ) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල වෙතින් නොමිලේ ලබා ගත හැකිව තිබුණද, සමාලෝචිත වර්ෂය තුළදී එම කාර්යමණ්ඩලය වෙත හෙපටයිටිස් බී එන්නත් කිරීම සඳහා පෞද්ගලික රෝහලක් වෙත රු.1,022,414 ක් ගෙවා තිබුණි. | ගිලන් රථ රියදුරන්ගේ පුහුණු පාඨමාලාව සම්පූර්ණ කිරිමෙන් පසුව රජයේ රෝහල් වෙතින් මෙම එන්නත ලබා ගැනීමට උත්සහ කලද මේ සම්බන්ධයෙන් රෝහල් කිහිපයක් පමණක් සහයෝගය දැක්වූ අතර එම ප්‍රදේශවල සේවය කළ කාර්ය මණ්ඩලයට රෝහල් මඟින් එන්නත් ලබාදුන් බව, ධනාත්මක ප්‍රතිචාරයක් නොලැබුණු දිස්ත්‍රික්කවල අපගේ කාර්ය මණ්ඩලය සඳහා එන්නත අනිවාර්ය බැවින් පුද්ගලික රෝහල්වලට සම්බන්ධ වීමට අපට සිදුවූ බව. | -එම- |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට පදනමේ අනුමත කාර්ය මණ්ඩලය 1,992 ක් වුවද, එදිනට තත්‍ය කාර්ය මණ්ඩලය 1,388 ක් වූයෙන් කාර්ය මණ්ඩල ඌනතාවය 604 ක් වූ අතර ඉන් 316 දෙනෙකු ගිලන් රථ රියදුරන් විය. | 2019 අගෝස්තු මාසයට පෙර බඳවා ගත් කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් වැටුප් නොමැතිකම හේතුවෙන් පදනමෙන් ඉවත්ව ගිය බව, වැටුප් වර්ධක සහ කාර්යමණ්ඩලය අනුමත කිරීමෙන් පසු බඳවා ගැනීමේ වැඩසටහනක් ආරම්භ කර සම්මුඛ පරීක්ෂණ 2019 අගෝස්තු මාසයේදී පැවැත්වීමට නියමිතව තිබුණද ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කිරීම හේතුවෙන් බඳවා ගැනීම් අත්හිටුවන ලද බව, ඉන් පසුව 2019 නොවැම්බර් මාසයේදී නැවත දැනුම් දෙන තුරු බඳවා ගැනීම් නතර | විධිමත් පරිදි අත්‍යාවශ්‍ය කාර්යමණ්ඩලය බඳවා ගැනීමටත් අත්‍යාවශ්‍ය නොවන තනතුරු තිබේ නම් ඒවා යටපත් කර කාර්යමණ්ඩලය සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතුය. |

කරන මෙන් අමාත්‍යාංශය දැනුම් දුන් බව, බඳවා ගැනීම් ආරම්භ කිරීමට අවසර ලැබුණේ 2021 පෙබරවාරි මාසයේදී බැවින් රජයේ රෙගුලාසිවලට අනුකූලව බඳවා ගැනීමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතින බව.

## 4. ශිණුම්කටයුතුභාවය සහ යහපාලනය
--------------------------------------

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 18 දරන 1990 සුවසැරිය පදනම පනතේ 2(2) වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පිඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, පදනම විසින් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන මාස 05 ක ප්‍රමාදයක් සහිතව එනම් 2021 ජූලි 27 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. | පදනම ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ උපදෙස් මත 2018 හා 2019 මූල්‍ය ප්‍රකාශන මුදල් පදනම මත පිළියෙල කළ බව, පසුව ජාතික විගණන කාර්යාලයේ උපදෙස් මත එම මූල්‍ය ප්‍රකාශන නැවත උපචිත පදනම මත පිළයෙල කිරිමට සිදුවීම හෙතුවෙන් 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ප්‍රමාද වූ බව හා 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන නියමිත පරිදි ඉදිරිපත් කරන බව. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

### 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම
----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක පීඑෆ්ඩී/ආර්ඊඩී/01/04/2014/01 දරන රාජ්‍ය මුදල් ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව දිගුකාලීන දැක්මක් සහිතව අදාළ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද පදනම විසින් එසේ සිදු කර නොතිබුණි. | 2022 වර්ෂයේදි චක්‍රලේඛය අනුව කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුය. |

### 4.3 අභ්‍යන්තර විගණනය
---------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 සහ 2019 ජනවාරි 12 දිනැති අංක ඩීඑම්ජේ/1-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව, පදනම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර | මූලික කාර්යමණ්ඩලය අනුමත කිරීමේදී කාර්යමණ්ඩල අවශ්‍යතා බොහොමයක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ප්‍රතික්ෂේප කළ බව, නැවත කාර්යමණ්ඩල අනුමැතිය සඳහා ඉල්ලීමක් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත යවා | අභ්‍යන්තර විගණන ඒකකයක් විධිමත් පරිදි ස්ථාපිත කළ යුතුය. |

| | | |
|---|---|---|
| නොතිබුණු අතර අභ්‍යන්තර විගණනයක් සිදුකරද නොතිබුණි. | ඇති බව හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් කාර්යමණ්ඩලය සඳහා අනුමැතිය ලැබුණු පසුව අභ්‍යන්තර විගණන ඒකකය පිහිටුවන බව. | |

**4.4 විගණන හා කළමනාකරණ කමිටුව**

---

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 ජනවාරි 12 දිනැති අංක ඩීඑම්ඒ/1-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව කාර්තුවකට 01 බැගින් වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවද, පදනම විසින් සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කිසිවක් පවත්වා නොතිබුණි. | මණ්ඩලය විසින් විගණන හා කළමනාකරණ කමිටුව පත් කර ඇතත් 2020 වසරේ පැවැති වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කළ පරිදි රැස්වීම් පැවැත්වීමට නොහැකි වූ බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කාර්තුවකට 01 බැගින් වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතුය. |

**4.5 අයවැය පාලනය**

---

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.5 ඡේදය ප්‍රකාරව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්ෂික අයවැයෙහි පිටපතක් මූල්‍ය වර්ෂය ආරම්භ වීමට දින 15 කට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, එහි පිටපතක් මෙම වාර්තාවේ දිනය වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව හා 2022 වර්ෂයේදී එම චක්‍රලේඛයට අනුව විගණකාධිපතිවරයා වෙත වාර්තා කිරීමට පියවර ගන්නා බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4.6 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී 17/දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර “2030 න්‍යාය පත්‍රය” පිළිබඳව සුවසැරිය පදනම විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් තම විෂය පථය යටතට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | පදනම තිරසාර සංවර්ධන ඉලක්කවල අරමුණු සඳහා ක්‍රියා කරමින් සහ සාක්ෂාත් කර ගනිමින් සිටින බව, 2020 වර්ෂයේදී පදනම රේඛීය අමාත්‍යාංශයේ දර්ශක සමඟ සම්පූර්ණයෙන්ම පෙළගැසී නොමැති බවෙ හා පෙළගැස්විය යුතු තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඇති බව. | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |